| | | |
|---|---|---|
| | මගේ අංකය | ;- MPS/01/07 |
| | எனது இல | ;- |
| | My No | :- |
| | ඔබේ අංකය | :- |
| | உனது இல | :- |
| | Your No | :- |
| **මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ | දිනය | :- 2022.05.20 |
| **மாலிம்பட பிரதேச சபை - மாலிம்பட** | திகதி | :- |
| **MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA** | Date | :- |

දු.ක./ෆැක්ස් **தொலைபேசி**/ **தொலைநகல்** Telephone / Fax:- 041-2240208


---

<u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාව</u>

<u>**2022.06.15** වන දින මාසික සභා රැස්වීම් වාර්තාව</u>

සහභාගීත්වය :-

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රවිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

නොපැමිණීම:- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 ජුනි මස මාසික සභා රැස්වීම 2022.06.15 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

***01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

2022 මැයි මස 17 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව 2022.05.17 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

## *02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන*

ජනානන්ද හාමුදුරුවන්ගේ උත්සවය සඳහා සහභාගීවෙන්න කියලා ආරාධනාවක් ලැබුණා. ඒක මන්ත්‍රීවරුන්ට බෙදන්න බැරිවුණා. ඒ වගේම අපි සභාවේ අවුරුදු උත්සවයට ලැබුණු තෑගි ටික සම්බන්ධ කරගෙන පොසොන් කූඩු ප්‍රදර්ශනයක් සහ භක්ති ගීත වැඩසටහනක් පවත්වනවා. මේ දෙකටම අදාළ ආරාධනා පත්‍ර වට්ස් ඇප් ගෲප් එකට දාලා තියෙනවා.

## *03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.*

- පාලටුව,මාලිම්බඩ,පොල්හේනවත්ත,අංක 29 හි එච්.ජී.ජනක් චන්දන ලොකුහෙට්ටි යන අය විසින් ඉදිරිපත් කරන ලද "දීර්ඝකාලීන බදු පදනමට රෝස් මවුන්ට් වත්ත - ඉල්ලුම්කිරීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ "නිවසට තිරසර ගෙවතු වගාවක් - 2022 යටතේ එහි ප්‍රතිලාභීන්ට කොම්පෝස්ට් පොහොර ලබා දියයුතු බැවින් සුල්තානාගොඩ කොම්පෝස්ට් ඒකකයෙන් පොහොර අලෙවි කිරීම තාවකාලිකව නතර කරන බව සඳහන් ලිපිය සභාගත කරන ලදී.
- 355ඊ නාපෙ ග්‍රාම නිලධාරී වසමෙහි ගම්වාසීන් විසින් ඉදිරිපත් කරන ලද "ප්‍රධාන මාර්ගයට බාධාවක්ව පවතින ගස් කපා ඉවත් කර ගැනීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- වැඩ අවසන් කරන ලද කර්මාන්ත සඳහා මුදල් ලබා ගැනීම සම්බන්ධව පහත නම් සඳහන් අය විසින් එවන ලද ඉල්ලීම් ලිපි සභාගත කරන ලදී.

| | | |
|---|---|---|
| හොරගොඩ බටහිර ගොවි සංවිධානය | - | හොරගොඩ ආඳදොළ පාර,ලිබර්ටි ටෙරන්ස් මාර්ගය,කෝරලේ දිවල සිට රංචගොඩ මාර්ගය |
| මාලිම්බඩ උතුර ප්‍රජා ජල මණ්ඩලය | - | ඕගස්පේ තේ කොළ ගෙදර පාර,රණවිරු මාවත, වීරමන් මාවත |
| සෙන්ට්‍රල් පාර්ක් ප්‍රජා ජල මණ්ඩලය | - | සෙන්ට්‍රල් පාර්ක් ජල ටැංකිය, සෙන්ට්‍රල් පාර්ක් සිංහ පටුමග,බෝගහ කොරටුව පාර,මහදූව පාර |
| කිරිමැටිමුල්ල දකුණ ගොවි සංවිධානය | - | වැවේ වත්ත ප්‍රගති මාවත |
| කඩුකන්න ගොවි සංවිධානය | - | වල්පිට ඩයස් ආරියතිලක පාර, වල්පිටවත්ත හේන පාර |
| අකුරුගොඩ උතුර විජය වැඩිහිටි සමිතිය | - | උස්ගොඩ යහලමුල්ල පාර |
| මාරගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය | - | පාළුමානගොඩ දිවෙල්වත්ත පාර අකුරැස්ස ප්‍රධාන මාර්ගය,පාරෙවත්ත මාර්ගය,මාරගොඩ තන්තිරිගෙවත්ත මාර්ගය |
| කිරිමැටිමුල්ල උතුර ගොවි සංවිධානය | - | කැරන්තොල්ල වැලිවිට මාර්ගය |

- සහකාර අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය, මාතර මගින් එවන ලද "ගොඩනැගිලි අයදුම්පත්‍ර පෙරසැරි කිරීමට අදාළව මහජනතාව වෙත පැන නැගී ඇති ගැටළු විසඳීම සඳහා වූ ජංගම සේවය පැවැත්වීමට සම්මන්ත්‍රණ ශාලාව ලබා ගැනීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

## *04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න -*

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්දුල දික්මාදූගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න</u>

I. මාලිම්බඩ බටහිර සෙන්ට්‍රල්පාර්ක් මාර්ගයේ ප්‍රියන්ත මහතාගේ සහ සෝමසිරි වීරමන් මහතාගේ ඉඩම ආශ්‍රිතව මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පැතිබැම්මක් ඉදි කර ගෙන යනවාද?

**සභාපතිතුමා –** ඔව්.

II. එසේ පැති බැම්මක් ඉදි කරන්නේ නම් එම පැති බැම්ම ඉදි කරනු ලබන්නේ කාගේ බලපෑමක් මතද?
**සභාපතිතුමා -** ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මත

III. පැති බැම්ම ඉදි කිරීම මත මාර්ගය පටු වී තිබෙනවාද? එසේ නොමැතිනම් පුළුල් වී තිබෙනවාද? **සභාපතිතුමා -** ඔව් එසේ පටුවී ඇත්නම් හෝ පුළුල් වී ඇත්නම් එම ප්‍රමාණය කොපමණද?
**සභාපතිතුමා -** තාක්ෂණ නිලධාරී වාර්තාව ඉදිරිපත් කර ඇත. අදාළ ප්‍රමාණය තාක්ෂණ නිලධාරී වාර්තාවේ ඇත. එම වාර්තාව අනුව පැතිබැම්ම නොමැති කොටසේ මාර්ගයේ පළල අඩි 16 කි.පැතිබැම්ම ආරම්භක ස්ථානයේ මාර්ගයේ පළල අඩි 19කි.පැතිබැම්ම මාර්ගයේ පළල අඩි 18කි.පැතිබැම්ම ඉදිකළ යුතු කොටසේ උස අඩි 12ක් වන අතර පොළවෙන් අභ්‍යන්තර අවම වශයෙන් අඩි 3ක් ගැඹුරට පැතිබැම්ම යෙදිය යුතුය.ඒ අනුව පැති බැම්ම අඩි 15ක් පමණ වන අතර එය කලු ගල් බැම්මක් වන බැවින් පාදම අඩි 6ක් පමණ පළල් විය යුතු ය.ඉහත පැති බැම්ම මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඇස්තමේන්තු සකස් කර එම ආයතනයේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් කර ඇති බැවින් අදාළ සැලසුම් එම ආයතනයෙන් ලබා ගැනීම සුදුසුය.

IV. පැති බැම්ම පළල සම්බන්ධව පළාතේ තාක්ෂණ නිලධාරීවරයෙකුගේ වාර්තාවක් ලබා ගත හැකිද?
**සභාපතිතුමා -** හැකියි.

V. තාප්පය ඉදි කිරීමේ කටයුතු නතර කර ඇත්තේ කාගේ බලපෑම මතද?
**සභාපතිතුමා -** ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තිබෙන බැවින් කිව නොහැක.

VI. යම් කෙනෙක් බලපෑම් කර ඇත්නම් එසේ බලපෑම් කිරීමට හේතුව කුමක්ද?
**සභාපතිතුමා -** තවදුරටත් මාර්ගය පුළුල් කිරීමට අවශ්‍ය ප්‍රමාණය ලබා ගැනීමට සහ වෙනත් කාරණා සඳහා ප්‍රමුඛතාවය ලබා දීම

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

**<u>යෝජනා අංක 5:1</u>**

2022/05/05 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**

2022/05/05 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2022/05/17 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**
2022/05/17 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:3</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව ගෙවතු වගාව සඳහා උනන්දුවක් දක්වන බැවින් පවතින ආහාර අර්බුදයට මුහුණ දීම සඳහා බල ප්‍රදේශයේ වගා කටයුතු කරන ජනතාවට අවශ්‍ය බීජ සහ උපකරණ ලබා දීම වෙනුවෙන් රුපියල් ලක්ෂ විසි පහක මුදලක් සභා අරමුදල් වෙන් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**
අද රටට අත්‍යවශ්‍ය කාරණයක් තමයි මේ වගා ව්‍යාපාරය. ගෙවතු වගාව කරන අයට ලියාපදිංචි වෙන්න අපි නාම ලේඛනයක් දීල තියෙනවා. ඒ සියලු දෙනාටම පොහොර සහ පැළ ලියාපදිංචි වන අනුපිළිවෙළට දෙනවා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:3</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව ගෙවතු වගාව සඳහා උනන්දුවක් දක්වන බැවින් පවතින ආහාර අර්බුදයට මුහුණ දීම සඳහා බල ප්‍රදේශයේ වගා කටයුතු කරන ජනතාවට අවශ්‍ය බීජ සහ උපකරණ ලබා දීම වෙනුවෙන් රුපියල් ලක්ෂ විසි පහක මුදලක් සභා අරමුදල් වෙන් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:4</u>**
සභාපනතේ පැවරී ඇති බලතල අනුව බල ප්‍රදේශයේ පදිංචි කරුවන් වෙනුවෙන් රැකියා වැඩ පිළිවෙලක් සංවිධානය කිරීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදල් යටතේ කොරියන් භාෂාව සහ ජපන් භාෂාව ප්‍රදේශයේ ජනතාවට ඉගැන්වීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**
හොඳ දක්ෂ ගුරුවරයෙක් තෝරගෙන ගුරුවරයාගේ වැටුප කමිටුවක් මගින් තීරණය කරමු. සහභාගී වන අයගෙන් ලියාපදිංචි ගාස්තුවක් අයකරල පාඨමාලාව නිවැරදිව සම්පූර්ණ කරන අයට පිළිගත් සහතිකයක් ලැබෙන පරිදි ඒ කටයුත්ත කරමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:4</u>**
සභාපනතේ පැවරී ඇති බලතල අනුව බල ප්‍රදේශයේ පදිංචි කරුවන් වෙනුවෙන් රැකියා වැඩ පිළිවෙලක් සංවිධානය කිරීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදල් යටතේ කොරියන් භාෂාව සහ ජපන් භාෂාව ප්‍රදේශයේ ජනතාවට ඉගැන්වීමටත්, ඒ සඳහා සහභාගී වන අයගෙන් ලියාපදිංචි ගාස්තුවක් අයකිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 5:5</u>**
වී අස්වැන්නේ අඩුවක් පවතින අර්බුදකාරී තත්ත්වයක් පවතින කාලය තුළ ගොවීන් ධෛර්යමත් කරලීම සඳහා සභා අරමුදලින් බීජ ඉසින යන්ත්‍ර (සීඩර්) 29 ක් සහ බැද්ද නෙලන (වීඩර්) යන්ත්‍ර 29 ක් ලබා ගෙන ග්‍රාම නිලධාරී වසම් 29 ක් සඳහා ප්‍රජා මණ්ඩල වලට හෝ ගොවිසමිති වලට ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>**
සභාපතිතුමා මේ සීඩර් එකක් කීයක් විතර වෙයිද?අපිට මේ විෂය අදාළද? ගොවිජන සේවා දෙපාර්තමේන්තුවක් තියෙද්දි සභාවක් විදියට මැදිහත්වෙන්න අපිට පුළුවන්ද? අනිත් එක ගොවීන්ට වී ටික ඉහිනවට වඩා කුඹුරු ටික හාගන්න බැරි ප්‍රශ්නයක් තියෙන්නෙ. ට්‍රැක්ටර් කුළියයි තෙල් ගැටලුවයි නිසා ඒක කරගන්න බැරිවෙලා තියෙනවා. අපිට පුළුවන් නම් ට්‍රැක්ටරයක් අරන් දීල මේකට මැදිහත්වෙලා කුඹුරු ටික හාල දෙන්න ඒක ඊට වඩා වටිනවා. ට්‍රැක්ටරය සභාවට ගොඩක් ප්‍රයෝජනවත්. ඒ වගේම අපිට ආදායමකුත් එනවා. මේ සීඩර් යන්ත්‍ර දුන්නම මොකක්හරි සමිතියක් ගනීවි. එක්කො එක පුද්ගලයකුගේ ගෙදරක තියේවි. මාසයක් යනකොට කැඩිල යාවි. කවුද මේව නඩත්තු කරන්නෙ.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**
මන්ත්‍රීතුමා රජයට මුදල් නෑ මේව ගොවි සමිතිවලට දෙන්න. අද රටට පොහොර ගේන්නෙ නෑ. ඒ නිසා හැම ගොවියෙකුටම අවශ්‍ය වෙලා තියෙන්නෙ වී ටික පෙළට දාලා ඊටපස්සෙ තණකොළ ටික නෙළා ගන්න. මේවට වියදමක් යන්නෑ. තෙල් ගහන්න අවශ්‍ය වෙන්නෑ. මේක ගමකට දුන්නට පස්සෙ ගොවි මහත්වරු ටිකට පුලුවන් කෘෂි රසායනික නැතිව කුඹුරු කරන්න. කෘෂිකාර්මික කටයුතුවලට වියදම් කරන්න පනතෙන් අපට බලය දීල තියෙනවා. අපිට පුලුවන් ඒක අනුමැතියක් අරන් කරන්න. කෘෂිකර්මයට අමාත්‍යාංශයෙන් සල්ලි දෙන්නෙ නෑ. දෙන්න සල්ලි නෑ. ඒ නිසා ගොවීන්ට පහසුවක් මේක.

**<u>ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා</u>**
2013 වර්ෂයේ ඉඳලා අපේ ගොවි සංවිධානයේ සභාපති වශයෙන් ඉන්නෙ මම. මමත් කුඹුරුවල බහින කෙනෙක් නිසා මම කුඹුරු ගැන දන්නවා. වර්තමානයේ එක ට්‍රැක්ටරයක් ගෙනල්ල මුළු මාලිම්බඩම කුඹුරු හාන්න බෑ. අඩුම තරමෙ කද්දුවවත් හාන්න බෑ. එක ග්‍රාම නිලධාරී වසමක කුඹුරු අක්කර 200 ක් පමණ තියෙනවා. ඇත්තටම සභාපතිතුමනි, අපේ ගොවි සංවිධානයේ බඩු මොනවත්ම තිබුණෙ නෑ මං එනකොට. නමුත් දැන් තණකොළ කපන යන්ත්‍ර, තෙල් ඉසින යන්ත්‍ර තියෙනවා. ඒව ගොවීන්ට ඉතාම වැදගත්. වර්තමානයේ ගොවීන්ට වල් නාශකවල හිඟයක් තියෙනවා. කුඹුරු වගා කරල දින 14 කින් වල්නාශක ගහන්න ඕන. දැන් ඒ තෙල් වර්ග නෑ. වල් නෙලන යන්ත්‍රයක් රු 7000.00 ක් වගේ වෙන්නෙ. ඒව ඉතාම වැදගත්. බීජ ඉසින යන්ත්‍ර නම් එකක් තුන් ලක්ෂ ගානක් වෙනවා. මේව ගොවි සංවිධානවලට ඕන දෙන්න. උදාහරණයක් විදියට උනින්දුවෙල අක්කර 20 ක් විතර වී වගා කරන කෙනෙක් ඉන්නවා. එයා වීඩර් යන්ත්‍රයෙන් නිතරම වල් නෙලනවා. ඒ කුඹුර ඉතාම සාර්ථකයි. බිම් මට්ටමේ ඉන්න වෙලකට බහින කෙනෙක්ගෙන් අහල මේ තීරණ ගන්න. මේක ඉතාම වැදගත් යෝජනාවක්. සභාපතිතුමාගේ ඔළුවට ඉතාම හොඳ යෝජනා එනවා. මේව ක්‍රියාත්මක කරන්න ශක්තිය ධෛර්යය ලැබෙන්න කියල ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා**

යෝජනාවක් ගේනකොට නිවැරදි වෙන්න ඕන. අපිටත් කුඹුරු තියෙනවා. අපිත් කුඹුරු කරල තියෙනවා. මෙතන ඉන්න හැමෝම කුඹුරෙ නියරෙ ඇවිදපු මිනිස්සු. අපි හදේ ඉඳන් තීරණ ගන්නෑ. අපි පොළවෙ ඉන්න නිසා තමයි සභාවේ විෂය පථය තුළ ඉඳන් කතා කරන්නෙ. සභාවේ විෂය පථයෙ නෑ ගොවිජන සේවාවලට උපකරණ අරන් දෙන්න කියලා. මේකට අපිට වියදමක් දරන්න පුළුවන්ද බලමු. සභා අරමුදල තුල ලක්ෂ 350 ට අඩු ගණනක් තියෙද්දි මේ වගේ යෝජනා දාලා අපේ විෂය පථය කරගන්න අන්තිමට අපිට මුදල් නැතිව යනවා. සරලව කිව්වොත් සීඩර් යන්ත්‍රයක් මිළදී ගන්න රුපියල් 73000.00 ක් විතර යනවා. ඒක දවසක් තල්ලු කරනකොට කඩන් වැටෙන් නැති ප්‍රමිතියක් තියෙන එකක් ඕන දෙන්න. සීඩර් යන්ත්‍ර ගන්න ගියොත් ඒකට විතරක් ලක්ෂ 24ක් 25ක් යනවා. ගොවියො වෙනුවෙන් පමණක් වැඩ කරන්න ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ආයතන රාශියක් තියෙනවා. මේව කරන්න ගියාම අපේ විෂය පථයට අදාළ දේවල් මගඇරෙන්න පුළුවන්. මේ කටයුත්තට විරුද්ධ වෙනවා නෙමෙයි, අපේ විෂය පථයයි මේ විෂය පථයයි අතර තියෙන සට්ටනයයි අපිට මෙතනදි පේන්නෙ. අපිට නීත්‍යානුකූලව ගොවි සංවිධානවලට උපකරණ දෙන්න බැහැ. ඔබතුමා යෝජනා කරල තියෙන්නෙ මේව ප්‍රජා මණ්ඩල වලට දෙන්න. එතකොට ගම තුළ ප්‍රජා මණ්ඩල සහ ගොවි සංවිධාන අතර ගැටීමක් ඇති වෙනවා. අපි මේ භාණ්ඩ ලබා දුන්නට පස්සෙ පසු විපරමක් කරන්න ඕන. අද අපට තීන්දු අරන් යන්න පුලුවන්. හෙට දවසෙ මේකෙ ඉන්න නිලධාරීන් තමයි ඒවට වගකියන්න ඕන. ලක්ෂ 25ක් විතර වියදම් කරල පසු විපරමක් නැතිවුණොත් මූල්‍යමය වශයෙන් ලොකු ලොකු ප්‍රශ්න ඇති වෙන්න පුවුවන්.

ඒ ප්‍රශ්න දකින නිසා තමයි මේ යෝජනාව ගැන පැහැදීමක් නැත්තෙ කියන එක කියන්න ඕන. අද කුඹුරු විශාල ප්‍රමාණයක් වගා නොකර අත්හැරල තියෙනවා ඒවට ට්‍රැක්ටරයක් දාගන්න බැරිව. අපි ඒව දකින්නෑ. වී ටික ඉහින්න කලින් අපිට කුඹුරු හාන්න විදියක් නැති එකට විසඳුමක් දෙන්න පුලුවන් නම් හොඳයි. ගොවීන්ට පොහොර ටික ගෙනියන්න විදියක් නෑ. වැඩසටහනක් තියෙනව නම් ඒ පොහොර ටික ගොවිජන සේවා එකේ ඉඳල ගොවීන් වෙත ගිහින් දෙන්න ඒක වටිනවා. මුදල් ටික වියදම් කරල ප්‍රයෝජනයක් නැත්නම් වැඩක් තියෙනවද? සමහර විට ගොවීන් එක්කෙනෙක් දෙන්නෙක් මේකෙන් ප්‍රයෝජනය ගන්න පුලුවන්. ඒ නිසා පොදුවේ යන වැඩපිළිවෙළකට අපි අවතීර්ණ වෙන්න ඕන කියන කාරණාව මම මතක් කරනවා.

**ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා**

සභාපතිතුමා ඔබතුමාගේ යෝජනාව අතිවිශිෂ්ටයි. සභාවෙන් එක ට්‍රැක්ටරයක් දීල බෑ. දැනට ට්‍රැක්ටර් 4ක් විතර වැඩ කරලත් මිනිස්සුන්ට වැඩ කරගන්න වෙලාව මදි. දැනට වල්පැළ නෙලීම පිළිබඳව ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා තියෙනවා. ඒකට හොදම විසඳුම විදියට මිනිස්සු හොයාගෙන තියෙන්නෙ පේළි දාලා වීඩර් කරන එක. දැනට හක්මණ ප්‍රදේශයේ සීඩර් යන්ත්‍රයක් ගමට එනවා. එයාල වී කුරුණියක් දාන්න රුපියල් 600.00ක් 700.00ක් අය කරනවා. ගමේ ගොවියෙකුට මෙවැනි යන්ත්‍රයක් තියෙනවානම් අහල පහල ගොවීන් හැමෝටම උදව් කරගෙන මේක කරන්න පුලුවන්. පනතෙන් ගැටලුවක් තියේනම් සභාපතිතුමා ඊට අදාළ කටයුතු කරන්න. එහෙම කරල මේවගේ දෙයක් ගොවියෙකුට දෙන්න පුලුවන් නම් ඒක ඉතාම වැදගත් වෙනවා. මොකද ගොවිතැන් කරන මිනිස්සු ගොඩක් ගැටලු මැද ගොවිතැන් කටයුතු කරන්නෙ. ඒක ඒ මිනිසුන්ට ලොකු සහනයක් වෙනවා. හැබැයි පොහොර ප්‍රවාහනයට ට්‍රැක්ටර් ඕන නෑ. එක ගොවියෙකුගෙන් පොහොර කිලෝ එකකට රු 2.00ක් අයකරල තමයි ගොවි සමිතිවලින් ගොවීන්ට පොහොර ටික ගිහින් දෙන්නෙ. මේකට විවිධ මතිමතාන්තර ඇති. මගේ මතය අනුව මම කියනවා බල ප්‍රදේශයේ ගොවිතැන් කරන ජනතාව වෙනුවෙන් කරන්න පුලුවන් උපරිම මෙහෙයක් තමයි මේක. පුලුවන්නම් මේක ක්‍රියාත්මක කරන්න. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා**

මන්ත්‍රීවරුන් නියෝජනය කරන සෑම කොට්ඨාසයකටම සීඩර් වීඩර් යන්ත්‍ර ඕන කියල අපිට කියන්න බෑ. මොකද ගොවි සංවිධානවලින් යෝජනා ගන්න ඕන ඒ අයට ඕන මොනවද කියලා. කිරිමැටිමුල්ල කොට්ඨාසයේ ලොකු කුඹුරු ප්‍රමාණයක් නැතත් ඒවායේ වැඩි වශයෙන් තියෙන්නෙ එරෙන කුඹුරු. සීඩර් වීඩර් දාලා ඒවායේ වැඩ කරන්න අමාරුයි. අපිට ඕන වෙලා ගොවිසංවිධාවලට සීඩර් එකක් ගිහින් දුන්නට මම නම් හිතන්නෙ නෑ කිරිමැටිමුල්ල කොට්ඨාසයට ඕක ප්‍රායෝගික වෙයි කියලා. ඒ නිසා අපේ කොට්ඨාසයට මොනවහරි ලබා දෙනවනම් ගොවිසංවිධානවලින් හරි කෘෂිකර්ම නිලධාරීන්ගෙන් හරි අහන්න. අපට ඕන දේ දීල ගෙවල් ඇතුළෙ තියන් ඉඳල වැඩක් නෑ. යෝජනාව හොඳ වුණත් ඒ ඒ කොට්ඨාසයට අවශ්‍ය දේ ලබා දෙමු කියල මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය**

ගරු සභාපතිතුමනි මේ යෝජනාව ඉතාම හොද යෝජනාවක්. නමුත් සමහර කුඹුරුවලට මේ යන්ත්‍ර භාවිතා කරන්න බැහැ. අපේ ප්‍රදේශයේ ගොඩක් කුඹුරුවල මේ යන්ත්‍රය යන්න බැහැ. නමුත් සමහර කුඹුරුවලට මේක ගොඩක් ප්‍රයෝජනවත්. ඒ වගේම ට්‍රැක්ටර් සම්බන්ධයෙන් කතා කළොත් කොට්ඨාසයට එකක් වෙන්න නෙමෙයි පොදුවේ සභාව තුළ අත්ට්‍රැක්ටර් 2ක් 3ක් අරගෙන ගොවීන්ට සහන මිළට දුන්නනම් ඒක ඉතාම වැදගත්. මේ වෙලාවෙ ගොවියො ඉතාම අපහසුතාවයට පත්වෙලා තියෙනවා මඩ වැඩ කරගන්න බැරිව. අපි උනත් එහෙමයි. ඒ නිසා ට්‍රැක්ටර් ලබා ගැනීම ගොවීන්ට ලොකු ප්‍රයෝජනයක් වෙනවා. ලක්ෂ 6ක් 7ක් දෙනකොට ට්‍රැක්ටරයක් ගන්න පුලුවන්. ඒ විදියට ට්‍රැක්ටර් තුන හතරක් අරන් දෙනවනම් ඒක වටිනවා. මේ යෝජනාවත් කාලෝචිතයි. නමුත් ඊට එහා ගිහින් ට්‍රැක්ටර් අරගෙන සභාවෙම ට්‍රැක්ටර් වැඩ කරන සේවකයො යොදාගෙන වැඩකරන ක්‍රමවේදයක් ගෙනියනව නම් වඩා හොඳයි කියල කියනවා.

**ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා**

ගරු සභාපතිතුමනි, වී අස්වැන්න විතරක් නෙමෙයි රටේම ලොකු ආහාර අර්බුදයක් තිබෙන වෙලාවක් මේක. වී විතරක් නෙමෙයි රටේ බොහෝ භෝග අඩුවන තත්ත්වයක් ඉදිරි මාසවලදී තියෙනවා. ඔබතුමා හොඳ උත්සාහයක් දරනවා මේවගේ සංකල්ප ගෙනල්ලා. ගෙවතු වගා සංකල්පය ඉන් එකක්. මම කියන්නෙ ගෙවතු වගා දහස අපි විධිමත් විදියට කරල ඒ දහසෙ අස්වැන්න අරන් පස්සෙ බලමු ඉන් ඉදිරියට යන්න. ඒ නිසා එතනිනුත් ඒ දාහ පනින්න එපා. අපි දැක්කා කොවිඩ් දවස්වලත් එක එක තැන්වල පැළ බෙදුවා. ඇට බෙදුවා. ඉතාමත් කිහිප තැනක විතරයි සාර්ථක ගෙවතු වගාවක් කළේ. අනිත් අය දුන්න නිසා අරගෙන ගියා. මගේ වසමේත් විස්සකට ආසන්න ප්‍රමාණයත් ඉතා සාර්ථකව ගෙවතු වගාව කරනවා. ඒ වගේ කොටසක් තෝරගෙන අපි ගෙවතු වගා සංකල්පය ක්‍රියාත්මක කරමු. වී අස්වැන්නෙ අඩුවක් තියෙනවා. ගොවිතැන් කරන්න දැන් අලුත් පරම්පරාවේ අය කුඹුරට බහින්නෙ නෑ. යන්ත්‍ර සූත්‍ර ඕන තමයි. හැබැයි දැන් එක මන්ත්‍රීවරයෙක් කියනවා සීඩර් එපා වීඩර් දෙන්න. තව කෙනෙක් කියනවා වීඩර් එපා සීඩර් දෙන්න. කෘෂිකර්මාන්තයට ඒ ඒ ප්‍රදේශවල භූ විෂමතාවය අනුව අවශ්‍ය වන යන්ත්‍ර සූත්‍ර විවිධයි. ඒ නිසා අපි ඒ ඒ ප්‍රදේශවල ගොවීන් සමග කතා කරන්න ඕන. මම දන්නවා අපේ ප්‍රදේශයේ බීජ ඉසින යන්ත්‍රයට නැඹුරුවක් නෑ. මීට පෙර කුළියට යන්ත්‍ර ගෙනත් මේ වැඩ කළා. නමුත් ගොවීන්ට අවශ්‍ය අස්වැන්න මේවායින් ආවේ නෑ. වල් නෙලන යන්ත්‍රය හොඳයි. මොකද දැන් ලංකාවේ වල් නාශක නෑ. තිබුණත් ඒවා අපේ දැන් තියෙන වල්පැළ මර්ධනයට සාර්ථක නෑ. ඒ නිසා වීඩර් කියන එක අපට බොහොම ප්‍රයෝජනවත්. ඔබතුමා හොයල බලන්න දැනට අපට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය තැන් වලට ඕව සපයල තියෙනවා. මම තොරතුරු හොයල දෙන්නම්. පහුගිය කාලේ අපේ රටේ විශාල ප්‍රශ්නයක් තිබුණා වී වේලාගැනීම පිළිබඳව. දැන් ඒකට මැෂින් ඇවිත් තියෙනවා. ගොවීන් ඉල්ලීමක් කළා වී වේලන යන්ත්‍ර ලබා දෙන්න කියලා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, ගොවිජන සේවා මධ්‍යස්ථානත් තියෙද්දී අපි මුදලක්

වියදම් කරනවා නම් වසම් මට්ටමින් ඒ සඳහා පැහැදිලි නිර්දේශයක් ගන්න ඕන. ඒක මෙතුමලා වගේ ගොවි සංවිධාන හා ගොවීන්ගෙන් තොරතුරු ලබාගෙන ඒ ඒ වසම්වලට අදාළ යන්ත්‍ර සූත්‍ර ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියල මම හිතනවා.

**<u>ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා</u>**

ඇත්තටම ඔබතුමාගේ යෝජනාව හොඳ යෝජනාවක්. නමුත් අපි මේක ක්‍රියාත්මක කිරීමේදී අපේ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා වගේ පොඩි පොඩි ගැටලු එනවා. කොට්ඨාස මන්ත්‍රීවරුන්ට දැනුම් දීල මේ ගොවි සමිති ඒකරාශී කරන්න කියල මම යෝජනා කරනවා. නැත්නම් එයාල රැස්වන දිනයක් තියෙනවා ඔබතුමා එදාට සහභාගී වෙලා හරි ඒ ගොවි සමිතියෙ නිලධාරී මහත්වරුන්ගෙන් අහන්න එයාලට අවශ්‍ය මොනවද කියන එක. ඒ අවශ්‍ය දේ අපි එයාලට දුන්න නම් හොඳයි කියල මම හිතනවා.

**<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>**

සභාපතිතුමනි, මේ යෝජනාව ගැන අදහස් බොහොමයක් මේ වෙනකොට ඉදිරිපත් වුණා. මේක කරල දෙන්න පුලුවන්නම් හොඳයි. අපේ අධ්‍යාපනය ගැන සෞඛ්‍ය ගැන සභාවෙන් බලනවා නම් හොඳයි. දරුවන්ට අංගසම්පූර්ණ කෑම වේලක් දෙන්න සභාවෙන් හොයල බලනවනම් හොඳයි. දරුවෙක් ලැබෙන්න ඉන්න මව්වරුන්ට පෝෂණයක් නැත්නම් ඒකත් ලබා දෙන එක හොඳයි. නොමිලේ දරුවන්ට පොත්පත් දුන්නට ටියුෂන් පන්තියකටවත් දරුවො යවා ගන්න බැරිවෙලා තියෙනවා ආර්ථික අපහසුතා නිසා. ඒකත් හොයල බලනව නම් හොඳයි. එහෙම ඉගෙනගන්න පුලුවන් ළමයි හිටියත් බස් කුළී ගෙවාගන්න බැරි ළමයි ගැන හොයා බලනවා නම් හොඳයි. ඒ වගේම සභාපතිතුමාගේ සංකල්පය වගේ රැකියාවක් ලබා ගන්න වෘත්තීය පුහුණුවක් දෙන්න පුළුවන්නම් හොඳයි. ඒක අපට අවශ්‍යම තමයි.

ඒ වුණාට අපි බලන්න ඕන මේ මුදල් ටික ඉවර කරාට පස්සෙ සභාවට නියමිත අපේ වැඩ කොටසක් තියෙනවා. ඔය මොන කොවිඩ් ප්‍රශ්න ආවත්, ආර්ථික අපහසුතා ආවත්, ඉන්ධන ගැටලු තිබුණත් ඊට එහා ගියපු සභාවට නියමිත වැඩ කොටසක් තියෙනවා. ඒ ටික අනිවාර්යයෙන් කරන්න ඕන. මේ මුදල් ටික ඔක්කොම ඉවර කරල දාලා පාරවල් කැඩිල කැලේ වැවිල තිබුණොත් අපේ වැඩ කරල නෑ කියල මිනිස්සු බනියි. ඊළඟට ප්‍රජා ශාලාවල, පෙර පාසල් වල සෙල්ලම් මිදුල් කැඩිල එතන ප්‍රශ්නයක් තියෙනවා. ඒ වගේම තමන්ගෙ නිවාස වල වැසිකිළි වල පිරිල තියෙනවා. ඒක අයින් කරගන්න අපේ සභාවේ ගලි බවුසරයක් නෑ. ඉතින් මාතරට හරි වැලිගමට හරි කතා කරල කිව්වම ඒ වැඩේට දවස් 4ක් 5ක් යනවා. ගලි බවුසරයක අවශ්‍යතාවය ඉටුගන්න නොහැකිවීම මත ගෙදරක උත්සවයක්වත් තියාගන්න බැරිවෙලා තියෙනවා. මේ ප්‍රදේශ බොහොමයක් ගංවතුරට යටවෙනවා. මාලිම්බඩ සභාවේ ප්‍රධාන අවශ්‍යතාවයක් තමයි ගලි බවුසරය. මම මේ යෝජනාව හොඳ නෑ කියන්නෙ නෑ. ඒ වුණාට අපෙන් කෙරෙන්න ඕන කාර්යයක් මග ඇරිල.

ඒ වගේම බලන්න අපට තියෙන්නෙ ට්‍රැක්ටර් 2යි. මාසෙකට සැරයයි පාරෙ තියෙන පොලිතීන් ටික ගෙනියන්නෙ. ඒවා ගෙනියන්න වාහනයක් නැතිලු. අපි ට්‍රැක්ටරයක් අරන් තිබුණ නම් අපට ඒ පොලිතීන් ටික සතියකට සැරයක් එකතු කරන්න තිබුණා. අපේ වගකීමක් ඒ මග ඇරිල තියෙන්නෙ. විදුලිය විසන්ධි වෙලා ගොඩක් තැන්වල විදුලිය නෑ. සභාපතිතුමාගේ යෝජනාව හොඳයි. හැබැයි මේ සල්ලි ටික ඉවර කරල දැම්මට පස්සෙ මොකද කරන්නෙ. අපේ මන්ත්‍රීතුමාලා කිව්ව වගේ අපි ගෙවතු වගාව හොඳටම කරමු. කිරිමැටිමුල්ල උතුර කොට්ඨාසය ගත්තොත් අක්කර 150 කට වැඩිය තියෙනවා.අපි එක වීඩරයක් අරන් දීල ඔය අක්කර 150 ගහන්න පුලුවන්ද? වතුර කැඩුවට පස්සෙ සතියක් ඇතුළත වපුරන්න ඕන. ඊළඟට අනිත් මිනිස්සු කියයි ඔයාලගේ පක්ෂෙ නිසා දුන්නා. ඥාතියෙක් නිසා දුන්නා. අන්න මන්ත්‍රීගෙ ගෙදර තියෙනවා කියලා. එවගේ අර්බුද එනවා.

හොඳක් කරන්න ගිහිල්ල අපට නරක නාමයක් එන්න පුලුවන්. ඒක සභාපතිතුමාට ආවත්, මන්ත්‍රීතමාලට ආවත් සභාවටනේ එන්නේ.

මේව මහජන මුදලින් අරන් දීපුවනේ. ඒ නිසා සභාපතිතුමා ගොවීන් වෙනුවෙන් යමක් කරන්නම ඕනනම්, මෙහෙම කරමු. ගමතුළ වී වගා කරන මිනිසුන්ගෙ වී ටික වී මෝල් හිමියො ගන්නෙ රු.60.00 , 70.00 කුණු කොල්ලෙටනේ. එහෙමනම් අපි ඔය ලක්ෂ 50න් වී ටික අරගෙන ගෙවතු වගා කරන අයටම සහන මිලට දෙමු. ඒතකොට සහන මිලට හාල් ටිකක් ලබා දෙන්නත් පුලුවන්. වියදම්වන මුදල නැවත සභාවට ගන්නත් පුලුවන්. එහෙම නැත්නම් අපි සභාවට වීඩරයක්, සීඩරයක් , ට්‍රැක්ටරයක් අරගෙන අතැරල දාල තියෙන කුඹුරු අක්කර 10ක් සභාවෙන් කරල පෙන්වමු. ඒකෙන් බිත්තර වී හදල ගොවීන්ට බිත්තර වී දෙන්නත් පුලුවන්. අඩු මිලට සහල් දෙන්නත් පුලුවන්. අක්කර 10ක් අපි හරි ප්‍රමිතියට කළොත් බිත්තර වී දීල අපට ආයෙ ඒ සල්ලි ටික හොයාගන්න පුලුවන්. අපි එහෙම වැඩක් කළොත් අපි වැඩකාරයො කියල පෙන්වන්න පුලුවන්. මේ සැරේ අක්කර 10ක් කරනවා. ඊළඟ සැරේ අක්කර 20ක් කරනවා. රජයට බිත්තර වී හොයාගන්න බැරිව ඉන්නේ. දැන් ඕන තුන්මස් වී. ඒ වුණාට ඒව හොයාගන්න නෑ. ඒ නිසා අපි ඒ වගේ වැඩපිළිවෙළක් කරමු සභාපතිතුමා.

කඩබඩු ඇරෙන්න අපිට සත පහක ආදායමක් එන්න තැනක් නෑනේ. හැබැයි මේ ගොවියන්ගෙ ප්‍රශ්න විසඳන්න ආයතන ඕන තරම් තියෙනවා.පළාත් සභාවේ ලක්ෂ 200ක් පමණ ලැබෙන කොට ලක්ෂ 50ක් දාලා තියෙන්නෙ කෘෂිකර්මාන්තයට. පළාත් සභාව තියෙන්නෙ ඒකට. අපේ මුදල්වලින් අපි අපේ ඩියුටිය කරමු. ජනතාවට ආදර්ශවත් දෙයක් කරන්න ඕන. ඒකට අපි කුඹුරු ටිකක් වගා කරමු. අපේ ඉඩම්වල අපි වගා කරමු. අපටත් හොඳ වගාවක් කරන්න පුලුවන්. අපි කාගෙහරි ඉඩමක් බද්දට අරගෙන වගාවක් දාලා ඒක මිනිස්සුන්ට අඩුවට දෙමු. ධූරකාලය ඉවර වෙනකොට මේ සල්ලි ටික අවසන් කරන්න නෙමෙයි, මේ මහපොළොවෙ අපි කවුරුත් ඉන්න ඕන. ඒ නිසා පක්ෂ පාට භේද අවශ්‍ය නෑ. උත්පාදනයක් එන විදියට වැඩක් කළොත් කරන්න පුලුවන්. නැත්නම් සභාපතිතුමාටත් බනිනවා. අපිටත් බනිනවා.

තව ටික දවසකින් අපේ සේවාවන් කරන්න මුදල් නැතිව යනවා. ආණ්ඩුවට සල්ලි නෑ කියනකොට සේවකයන්ටත් සභා අරමුදලින් වැටුප් ගෙවන්න කිව්වොත් අපි මොකද කරන්නෙ. එතකොට බඳවගත්ත කම්කරුවො ගෙවල්වල නතර කරන්න වේවි. සේවා කාලය සතියකට දින 4ක් කරන්න හදනවා. දවස් හතරකට සීමා කළාම අපේ සභාවල වැඩ කටයුතු කරගන්න බැරිවෙනවා. ඔබ , මම වගේම මේ සියලු මන්ත්‍රීවරුත් කුඹුරු වැඩ දන්නවා. ඒ වුණත් සභාපතිතුමා අපි පෞද්ගලිකවම සාකච්ඡා කරමු මේ සභාවේ මුදල් අවසන් නොකර, සභාවටත් ආදායමක් එන විදියට , ජනතාවටත් සේවයක් වන පරිදි මොනවද කරන්න පුලුවන් කියලා.

<u>ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා</u>

සභාපතිතුමනි මේ රටේ ගොවි ජනතාව ගැන විශ්වාසයෙන් තමයි අපි ඉන්නෙ. ඒ විශ්වාසයට සභාව විදියට මොනයම්ම ආකාරයෙන් හරි හයියක් වෙන්න පුලුවන් නම් ඒක තමයි සභාවක් විදියට අපි කළයුතු කාර්යය. සභාපතිතුමනි අපි දන්නවා විශාල ප්‍රශ්නයක් වුණා පොහොර ප්‍රශ්නය. ජනාධිපතිතුමා පොහොර සම්බන්ධයෙන් දැඩි තීන්දුවක් ගත්තා. ඒක ලොකු විනාශයක් වුනා. හැබැයි සභාපතිතුමනි ඒ හරහා විශාල දෙයක් අහිමිවුනා විශාල අප්‍රසාද ඇතිවුනා. ඒ නිසා සීතල කාමරවල ඉන්න උදවිය ගන්න තීන්දු තීරණ ගන්නැතිව ගමේ ප්‍රායෝගිකව අපිත් එක්ක ඉන්න ගොවි මහත්වරු එක්ක කතා කරල එයාලට අවශ්‍ය දේ දෙන එක තමයි මේ වෙලාවේ කළ යුතු දේ.

අපේ මන්ත්‍රීවරුන් කිව්වේ ඔබතුමා ඔය දෙන්න හදන යන්ත්‍ර සමහර ප්‍රදේශවලට ගැලපෙන්නෑ. සමහර ප්‍රදේශවලට පමණක් ගැලපෙනවා කියලා. ඒ නිසා ගොවි මහත්වරු

සමඟ සාකච්ඡා කරන්න ඕන. මොකද අපි ගොවිතැන් කරනවා කිව්වට මෙතන හොඳම ගොවියො නෑ මම හිතන්නෙ. අපේ සමන් දෙනිපිටිය මන්ත්‍රීතුමා කිව්වා වගේ සභාවෙන් කෙරෙන්න ඕන කාර්ය භාර්ය අකුරටම කෙරෙන්න ඕන. එහෙම වුණත් මේ වෙලාවේ අපි මේ ගෙවතු වගාවන් සඳහා මූලික තැන දෙන්න අවශ්‍යයි. මොකද රට මේ යන විදියට ලොකු අසීරුතාවයකට පත්වෙනවා. ඒ නිසා අපි ගොවි ජනතාව දිරිමත් කරල මේ ගෙවතු වගාවලට උපකාර කරන්න ඕන. අපේ සභාව සතු ගොඩක් ඉඩම් තියෙනවා. මේ ඉඩම්වල වගා කරන්න ගොඩක් අය ඉදිරිපත් වුනත් ඒ අයට බීජ නෑ. පැළ නෑ. මෙවැනි ප්‍රශ්න තියෙනවා. ඒ නිසා ඔබතුමා නැවත මන්ත්‍රීවරුන් සහ ගමේ ගොවි ජනතාවත් සමඟ කතා කරල ගමේ ගොවි ජනතාව දිරිමත් කරන්න පුලුවන් යෝජනාවක් ගෙනල්ල ඒකට අවශ්‍ය බීජද, පැළද ඔය කියන උපකරණද කියල තීන්දුවක් දෙන්න පුළුවන්. මේ වෙලාවේ අපේ සමන් දෙනිපිටියගේ මන්ත්‍රීතුමා ගලි බවුසරයක් ගමු කියල යෝජනාවක් කළා. මම ඔබතුමාටත් කියනවා නැවත වතාවක් මේ වෙලාවේ රටේ අවශ්‍යතාවය වෙලා තියෙන්නෙ ආහාර ප්‍රශ්නය නිසා අනෙක් දේවල් ටිකකට පස්සට දාලා ගොවි ජනතාව දිරිමත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ඒ අය සමඟ සාකච්ඡා කරල නිවැරදි තීරණයක් ගෙන ක්‍රියාත්මක කරමු කියල.

<u>ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා</u>

සභාපතිතුමා මේක පනතෙ කොතනක හරි  අතුරු තැනකට දාලා ගලපන්න උත්සහ කරන්න පුලුවන්.  නමුත් මම හිතන්නෙ මේක පනතට සෘජුව හෝ වක්‍රව අනුකූලද කියලා. අද රටේ ප්‍රාදේශීය සභාවලට තියෙන  අභියෝග, මූල්‍ය අර්බුද අපිට තියෙන ගැටලු හැටියට මම දකිනවා.

ඒ වගේම සභාපතිතුමනි, වෙනත් මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ඉදිරිපත් කළොත් ඒකෙ අඩුපාඩු තියෙන්න පුලුවන්. නමුත් ඔබතුමා සභාපතිතුමා. ඔබට අත්දැකීම් තියෙනවා. මාණ්ඩලික පත්‍රිකාවක් සකස් කරල මේ යෝජනාව ගෙනාව නම් මේ අර්බුදය පැන නගින්නෙ නෑ. සභාපතිතුමනි දැන් මේ වීඩර් යන්ත්‍ර සීඩර් යන්ත්‍ර යෝජනාව ගේනකොට මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තියෙන ගොවිතැන් කරන කුඹුරු යායවල්වල විවිධත්වයක් තියෙනවා. සමහර මන්ත්‍රීවරු කියනව වගේ මේවා සමහර ප්‍රදේශවලට වැදගත්. සමහර ප්‍රදේශ වලට නෙවැදගත්. නමුත් කෘෂිකර්ම උපදේශක මහත්වරු ගෙන්වල සාකච්ඡා කරල උපදෙස් අරන් මේ යෝජනාව හැදුවනම් මේක මීට වඩා ඵලදායී වෙනවා. එහෙමනම් මේකෙ තියෙන ඵලදායිතාවය හා විවිධත්වය පිළිබඳව මගපෙන්වීමක් එනවා. අනික මේ වීඩර් යන්ත්‍ර ගැන මම එකක් කියන්න ඕන. 2019 අවුරුද්දෙ යහපාලනය ආණ්ඩුව කාලේ වීඩර් යන්ත්‍ර 2ක් පමණ ප්‍රාදේශීය ලේකම්එකට හෝ ගොවිජන සේවා එකට ආවා. නමුත් ඒවා ගන්තෙ නෑ. ගොවියොන්ට එක්කෝ මේවා ගැන අවබෝධයක් නෑ. එහෙම නැත්නම් වුවමනාවක් නෑ.

සමහරවිට ගොවි සංවිධානයක් හෝ ගොවියෝ කීපදෙනෙක් හෝ කියපු නිසා මේ යෝජනාව ගේන්න ඇති. ඒ නිසා මේක මීට වඩා පුලුල්ව සාකච්ඡා කරල පුලුල්ව සොයල බලල දැම්මනම් හොඳයි. මේ ගොවීන්ට මීට වඩා වුවමනා මීට වඩා ප්‍රයෝජනවත් දේවල් ඇති. ඒ ගැන හරියට පූර්ණ විමර්ශනයක් කරල මේ යෝජනාව නොදැම්ම නිසා තමයි මේ තරම් විවේචන අදහස් එන්නෙ. අද සමස්ත රටම ආයතන සියල්ලම දැවැන්ත ආහාර අර්බුදයකට මුහුණ දීල තියෙනවා. මන්ත්‍රීතුමා කිව්වා වගේ පොහොර සම්බන්ධයෙන් ජනාධිපතිතුමා ගත්ත අවිධිමත් තීරණය නිසා තමයි මේ ගැටළු ඇතිවෙලා තියෙන්නෙ. අපි අද ගත්ත අවිධිමත් තීරණ සමහර

විට මාස හතරකට පහකට අවුරුද්දකට පස්සෙ බරපතල විදියට බලපාන්න පුලුවන් අපි ගත්ත සමහර තීරණ වැරදි කියල ඔප්පු වෙන්නෙ සමහර විට තව අවුරුද්දක් විතර ගියාම. මම මේ කියන්නෙ අපි සමහර ගත්ත තීරණ ගැන ආපසු හැරිල බැලුවම ප්‍රයෝජනයක් නෑ. අපේ තීරණ වැරදුනොත් අපට පසු කාලීනව පසුතැවෙන්න සිදුවෙන්න පුලුවන්. චෝදනාවලට ලක්වෙන්න පුලුවන්. ඒ නිසා මේ වෙලාවේ අපි මුදල් සම්බන්ධයෙන් ගන්න තීරණ නිවැරදි තීරණ වෙන්න ඕන. ඒ නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් පූර්ව විමර්ශනයක් කරල නිවැරදි තීරණයක් ගන්නා හැටියට ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**</u>

ඒ අදහස්වලින් සමහර අයගේ එක එක පෞද්ගලික මත ප්‍රකාශ වුණා. එතනදි මම පළමුව කියන්න ඕන මේ චෝදනා කීපයක් ඇවිල්ල තියෙනවා. සාකච්ඡා කරල තීරණ ගත්තෙ නෑ. පසු විපරමක් කරන්නෙ කොහොමද? මුදල් වැය කරන්නෙ කොහොමද? මීට වඩා හොඳ යෝජනා තියෙනවද, ආදී වශයෙන් විවිධ කාරණා තියෙනවා. ගරු මන්ත්‍රීවරුනි, මම යෝජනාවක් ගේන්නෙ මගේ පෞද්ගලික මතයට නෙවෙයි. ඇත්තටම යම්කිසි යෝජනාවක් ආවහම මම ඒක පසුපසම යනවා. මම ලියන්නන් වාලේ යෝජනා දාන්නෙ නෑ. මට මේ යෝජනාව ඔළුවට ආපු දවසෙ මම මේ යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර ඇසිය යුතු හැම කෙනාගෙන්ම මේක ඇහුවා. පළමුව විමසුවේ විමර්ශන නිලධාරී සහ පළාත් පාලන කොමසාරිස්ගෙන්, අපේ ප්‍රජා සංවර්ධන නිලධාරිනියගෙන් පනතෙ පැහැදිලිවම තියෙනවා. කෘෂිකර්මය සඳහා වියදම් කරන්න පුළුවන් කියලා. බලයක් නැතිව මම මේ යෝජනාව ගෙනාවෙ නෑ. මං ඇහුවා අපේ කුඹුරු වැඩ කරන මන්ත්‍රීවරුන්ගෙන්. දිස්නා මන්ත්‍රීතුමියගෙන් ඇහුවා. නාලක මන්ත්‍රීතුමාගෙන්, බන්දුල මන්ත්‍රීතුමාගෙන් ඇහුවා. එතුමන්ලා සියලු දෙනාම කිව්වේ මේක ඉතාම වැදගත් යෝජනාවක්. ඊට පස්සෙ ගොවිජන සේවා නිලධාරීතුමියගෙන් ඇහුවා. ඒ ගොවිජන සේවා නිලධාරිතුමිය කිව්වෙ මේක ඉතාමත් හොඳ යෝජනාවක් කියලා. කෘෂිකර්ම උපදේශකතුමාගෙන් ඇහුවා. මේ යන්ත්‍ර සූත්‍ර තියෙන තැන් පිළිබඳ විස්තර හෙව්වා. ඊට පස්සෙ මම අපේ කණ්ඩායම් රැස්වීමට දැම්මා. කණ්ඩායම් රැස්වීමේදී කවුරුත් මේකට එකඟවෙලා ක්‍රියාත්මක කරමු කියනෙක තමා හැමෝම කිව්වේ. ඒ නිසා තමුන්නාන්සේලා ගෙනාපු චෝදනාවල මේක හොයන්නෙ බලන්නෙ නැතිව ගෙනාව කියන චෝදනාව පිළිගන්නෙ නෑ. සියල්ල හොයල බලලා ගෙනාවේ. පනතෙ තියෙන ක්‍රියාත්මක කළ හැකි වියදමක් වන දෙයක් තමයි මේක. ඊට පස්සෙ මම ගොවි සමිති වලිනුත් ඇහුවා.

ඊට පස්සෙ කවුද මේක පසු විපරම් කරන්නෙ කියන චෝදනාව ඇවිත් තියෙනවා. දැන් ඔබතුමාල දන්නවා කොට්ඨාසයට ඉන්න මන්ත්‍රීවරු හා නිලධාරීන් ඒ කොට්ඨාසෙ ඉන්න නිලධාරීන්ට මෙතනදී යම් කාර්යභාර්යයක් කරන්න තියෙන්න ඕන. පසු විපරම කිරීමේ ගැටලුවක් නෑ. පසු විපරම් කිරීමේ නිලධාරියෙක් අපිට ඉන්නවා. ඒ වගේම තවත් අය කිව්වේ අපේ කුඹුරු හාල දුන්නොත් හොඳයි කියලා. නමුත් අපි මේ හැමදේම බලන්න ඕන. ට්‍රැක්ටර් ගන්නව නම් ට්‍රැක්ටර් 3ක් අරගෙන අපට මේ ප්‍රශ්නය විසඳන්න බෑ. මොකද මේකෙ ලොකු අර්බුදයක් තියෙනවා. අක්කර 5000ට වැඩි ප්‍රමාණයක් කුඹුරු තියෙන තැනකට ට්‍රැක්ටර් තුන 4ක් දාලා මේ කටයුත්ත කරන්න බෑ. ගොවීන්ගේ ආර්ථික තත්ත්වය හැටියට ඒ වගේම නොමිලේ හාල් දෙනව කියන එකත් කරන්න බෑ. මේ පවතින තත්ත්වය අනුව ඩීසල් ගන්න එකත් ගැටලුවක්. ඒ නිසා ක්ෂණික ප්‍රයෝජනයක් තියෙන දේවල් තමයි අපි කලේ. සීඩර් වලට ඩීසල් ඕන නෑ. මේකෙදි ඇත්තටම පවතින්නාවූ වාතාවරණය මත අපි දන්නවා රසායනික පොහොර, වල්නාශක එන්නෙ නෑ. වල්නාශක ගැහුවොත් අනිවාර්යයෙන්

රසායනික පොහොර ගහන්න ඕන. මම වල්නාශක සහ පොහොර නොගහ වගාකරල තියෙනවා. හොඳම අස්වැන්නක් ගත්තා. පළමුව පොහොර ගැහුවට පස්සෙ රෝගයක් එනවා. වල්නාශක ගහන්න ඕන. හැබැයි මේ යන්ත්‍රයෙන් වී ටික පෙළට දැම්මට පස්සෙ වී අතර තියෙන තණකොළ නෙලා ගැනීමේ ක්‍රමයක් තියෙන්න ඕන. ඒකට තමයි වීඩර් යන්ත්‍රය තියෙන්නෙ.

ඒ වීඩර් යන්ත්‍රයත්, සීඩර් යන්ත්‍රයත් දෙකම ගැන සොයා බැලුවා. වැඩ කරන හැටි බැලුවා. ඒව දැනගෙන තමයි මේ කතා කරන්නෙ. වල් නාශක කෘෂි රසායන නැති එකට මගේ අධ්‍යයනය අනුව හොඳම විසඳුම තමයි සීඩර් හා වීඩර් යන්ත්‍ර. අපි ගොවි සමිති වලිනුත් අදහස් ගමු. ඒක හොඳයි. අපි ප්‍රවේශ විය යුතු හොඳම දේ තමයි අඩු වියදමකින් වැඩි ගොවීන් පිරිසකට සහනයක් දෙන්න පුලුවන් වෙන්නේ මේ යන්ත්‍ර දෙකෙන්. මේ දෙකටම උපරිම යන්නෙ රු. 50000යි. මේ ටිකට ලක්ෂ 15ක් යයි. හැබැයි ට්‍රැක්ටර් ගත්තොත් ලක්ෂ 150ක් දෙසීයක් යයි. ඒ වගේ දේකට අපිට යන්න බෑ. අපි ඉන්න තැන තේරුම් අරන් කරන්න පුලුවන් දේ කරන්න ඕන. ලක්ෂ 15කින් අපට ලොකු සේවයක් කරන්න පුලුවන්.

ඊළඟ චෝදනාව තමයි සමහර අයට කුඹුරු නැති තැන් තියේය කියල කොට්ඨාශයේ. හැබැයි අක්කර භාගයක් හරි තියෙනවා. කිරිමැටිමුල්ල, අල්ස්වත්ත, අධිකාරිවිලගම, කැරුන්තොල්ල, දෙද්දුවෙල කුඹුරු තියෙනවා. සාගර මන්ත්‍රීතුමා කියනවනම් ඊට වඩා හොඳ දෙයක් කරන්න පුළුවන් කියල. කිසි ප්‍රශ්නයක් නෑ. ඒ යන වියදම ගණනය කරල , ගොවීන් සමඟ සාකච්ඡා කරල අඩු වියදමකින් සහනයක් දෙන්න පුළුවන් දෙයක් කරමු. ඒ වගේම උපසභාපතිතුමත් කිව්වෙ මේක කළ යුතුයි කියන එක තමයි. ඒ නිසා ප්‍රායෝගික තත්ත්වයක් තිබුණත් කොට්ඨාශ දෙකකට හැර අනෙක් සියලුම කොට්ඨාශවලට මේව ප්‍රායෝගිකව ප්‍රයෝජනවත් වෙනවා. ඊළඟට අපට ඉඩම් තියෙනවා තමයි. අපි අවුරුදු 10කට බදු දෙන්නෙ විගණන තත්වය මත. නිලධාරීන් මේකට අතගහන්න බයයි. සභාවෙන් ගොවිපොළක් දානවනම් හොඳයි. නමුත් එය කරන්න අපහසුයි. ඒවා කිරීම ප්‍රායෝගික නෑ. මේ වසර තුල කළ හැකි දෙයක් අපි කරමු. ජනතාව වෙත ප්‍රවේශ විය යුතු දෙයක්, ගොවි ජනතාව වෙත කළයුතු දෙයක් ,රටටම සේවයක් වන දෙයක් අපි කරමු. ගොවි ජනතාවට යමක් කරනවා කියන්නෙ රටටම කරන සේවයක් . ඒ නිසා අඩුවියදමකින් උපරිම ප්‍රතිලාභ ලැබෙන නිසා තමයි මේ වගේ යෝජනාවක් දැම්මෙ. අපි මේ යෝජනාව ගෙනාවේ ඊළඟ කන්නයේ ප්‍රයෝජනය ගන්න.

**<u>තීරණ අංක 5:5</u>**

ගොවිජනතාවගේ අදහස් ලබාගෙන අධ්‍යයනයක් සිදුකර ඉහත යෝජනාව නැවත ඉදිරිපත් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:6</u>**

ඉන්ධන අර්බුදයට පිළියමක් වශයෙන් නිලධාරීන්ගේ රාජකාරි කටයුතු ඉටු කරලීම සඳහා සභා අරමුදලින් ත්‍රීරෝද රථයක් මිලදී ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

මෙම යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**<u>යෝජනා අංක 5:7</u>**

බල ප්‍රදේශයේ අවශ්‍ය තැන් වලට වීථි පහන් අලුතෙන් සවි කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය</u>**

බල ප්‍රදේශයේ අවශ්‍යතාවයට වීථි පහන් සවිකිරීමට යෝජනාවක් ගෙනත් තියෙනවා. අපි අවුරුදු 4ක් සභාවේ සභිකවරු විදිය ඉඳල මේ යන්නෙ අපිට ණයට දීපු අවුරුද්දක්. අපට මේ අවුරුදු 4 තුලම බල ප්‍රදේශයේ අවශ්‍ය තැන්වලට වීථි පහනක් දල්වන්න බැරි වුනානම් තවත් අවශ්‍ය තැන් මේ බල ප්‍රදේශයේ තියෙනවනම් අපේ කාර්යය භාර්යයෙන් වැඩක් නෑ. තවත් අලුතින් වීථි පහන් සවි කරන්න තියා දැනට සවිකරල තියෙන වීථි පහන්වල නඩත්තු කාර්යයන් පවත්වාගෙන යන්නත් දැනට බැරිවෙලා තියෙනවා. ලයිට් එක කැඩුනොත් දාන්නෑ. ස්විච් එකක් කැඩුනොත් දාන්නෑ. එහෙම තැනක අවශ්‍ය තැන් කියල දාලා තියෙනවා. මේ අවශ්‍ය තැන් නම් කරන්න. ඒත් එක්කම විශාල බලශක්ති අර්බුදයක් තියෙන සමාජයක මේ තවත් වීථි පහන් සවිකරන්න කියන එක මට නම් තේරෙන්නෙ නෑ. වාහනයේ ඩීසල් නැත්නම් බයික් එකකින් හරි ගිහින් බලන්න උදේ 10.00-11.00 අතර පාරේ කොච්චර බල්බ් දැල්වෙනවද කියලා. අපි වියදම් කරන්නෙ අපේ සල්ලි නෙවෙයි. මේ රටේ සල්ලි. මහජනතාවගේ සල්ලි. මේ වැයකරන රුපියලටත් අපි වගකියන්න ඕන. අපි සංවර්ධන යෝජනා ගේන්න ඕන. නමුත් අද රටේ තියෙන තත්ත්වයත් එක්ක වඩා ප්‍රයෝජනවත් දේ විතරයි කරන්න ඕන. මම නම් ඒකමතිකවම මේ වීථි පහන් දල්වන එකට නම් විරුද්ධයි. අපි සභිකයෝ වෙලත් වසර 4කට පස්සෙ අවශ්‍ය තැන් මේ බල ප්‍රදේශයේ තියෙන්න බෑ.

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>

ගරු සභාපතිතුමනි, අපේ බල ප්‍රදේශයේ ගොඩක් අය ඉල්ලීම් කරල තියෙනවා වීථි පහන් සවි කරල දෙන්න කියලා. නමුත් පසුගිය කාල සීමාව තුළ පැවති විදුලි අර්බුදය නිසා ඒ ගැන උනන්දු වුණේ නෑ. මේ ළඟදිත් කිහිපදෙනෙක් මට කිව්වා දැන් සභාවෙන් අක්‍රීය වෙච්ච ලයිට් හදන් නැහැ කියලා. මේ රටේ පවතින අර්බුදයත් එක්ක යම් යම් පිරිස් පාරවල්වල සංවිධානය වෙලා ඉන්නවා, ලයිට් දාල තියනකොට මේ පාරවල්වල යන එන අය අඳුරගන්න පුලුවන්. නමුත් වීදි පහන් අක්‍රිය වී ඇති නිසා ඒකත් කරගන්න බැරිවෙලා.ඒ නිසා විදී පහන් සවි කරල දෙන්න කියලා ජනතාව කියනවා. වීථි පහන් අලුතින් සවි කිරීම යම් තරමක් ප්‍රමාද වුනත් අක්‍රීය වී ඇති වීථි පහන් හදල දුන්නනම් හොඳයි. සුදේශ් මහතාගෙන් ඇහුවම කියනවා. ගබඩාවෙන් බඩු දෙන්නෑ කියලා. ඉතින් සභාපතිතුමා අපේ ප්‍රමුඛ කාර්යභාර්ය වෙච්ච මේ වීථි පහන් අලුත්වැඩියා කර ගන්නත් අපිට බැරිවෙලා තියෙනවා. රටේ යම් යම් ප්‍රශ්න මතු වෙමින් පවතින නිසා වීථි පහන් නඩත්තු කටයුතු සිදු කරන එක හොඳයි කියල මම අදහස් කරනවා. ඒ වගේම අවශ්‍ය ස්ථාන හඳුනාගනිමින් මහජන ඉල්ලීම් මත විදුලිපහන් සවි කරන්න පුලුවන්නම් හොඳයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා</u>

අපට කිහිප සැරයක් විදුලි පහන් සවි කරන්න පුලුවන් කම ලැබුනා. නමුත් දැන් වෙනදට වඩා නිවාස හැදිල පාරවල් හැදිල ජනාකීර්ණ වෙලා තියෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම අත්‍යාවශ්‍ය තැන් කිහිපයකටම වීථි පහන් අවශ්‍ය වෙලා තියෙනවා. ජනතාව ගොඩක් ගැවසෙන තැන්වලට වීථි පහන් සවිකරල දෙන්න කියල ජනතාවගෙ ඉල්ලීම් ගොඩක් තියෙනවා. ඒ නිසා මම නම් කියන්නෙ මොන අර්බුදය තිබුණත් පුළුවන්නම් සියලුම අත්‍යාවශ්‍ය තැන් වලට විදුලි පහන් දාලා දෙන්න කියලා. මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>

හර්ෂණී ගුණසේකර මන්ත්‍රීතුමියගේ අදහසට අපි එකඟයි. විදුලි අර්බුදයක් පවතින අවස්ථාවකදී අපි විදුලිය අරපරිස්සමින් භාවිතා කරන්න ඕන. එහි කිසිදු සංවාදයක් නැහැ. හැබැයි වසර 3ක පමණ කාලයක් තිස්සේ අලුතින් වීථි පහන් සවි කලේ නැහැ කියන එක අපි හොඳටම දන්නවා. ටියුබ් ලයිට් තිබුණු තැන්වල ටියුබ් ලයිට් ඉවත් කළා. මොකද ඒවට වැඩිපුර විදුලිය දහනය වන නිසා. ඒ සියල්ල අයින් කරලා ආධාරක සහිත CFL සවි කලා. සමහරු දැක්කේ ඒක අළුතින් විථි පහන් සවි කිරීමක් හැටියට. ඇත්තටම නිලධාරීන් දන්නවා පැරණි විථි පහන් ඉවත් කරලා ඒ වෙනුවට තමයි අපි වීථි පහන් දැම්මේ කියලා. ඒ වගේම වීථි පහන් බිඳපු තැන් වලටත් වීථි පහන් සවි කළා. එහෙම නැතිව අලුතින් වීථි පහන් ස්ථාපනය කලේ නැහැ. මම මීට කලින් සභාවටත් වෙනත් කරුණු යටතේ මෙම අදහස ඉදිරිපත් කළා. මොකද විදුලි පහන් අත්‍යාවශ්‍ය තැන් බොහොමයක් තියෙනවා. මන්ත්‍රීතුමන්ලා දෙපල කිව්වා වගේ ඉඩම් වෙන්දේසි වලින් පහුගිය අවුරුදු 3 ඇතුලත ඉඩම් කැබලි කරලා විශාල නිවාස සංකීර්ණ ඉදිවෙලා තියෙනවා. අපේ ප්‍රදේශයෙත් එවැනි වෙන්දේසි ඉඩම් 2ක් තියෙනවා. ඒවයේ තියෙන නිවාස වලින් අපට ඉල්ලීමක් කරලා තියෙනවා අත්‍යාවශ්‍ය තැන් වලට වීථි පහන් සවි කර දෙන ලෙස.

කඩවල් වල නාම පුවරු වල සවි කරපු බල්බ් තුලින් විශාල විදුලි ප්‍රමාණයක් අපතේ යනවා. නාම පුවරු වල රෑ එලිවෙනකම් විදුලි පහන් දල්වලා තියෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කළා විදුලි අර්බුදයක් තියෙන නිසා ඒවා වසා දමන ලෙස. හැබැයි රාත්‍රියට කඩවල්වල නාම පුවරු වලින් විශාල ආලෝකයක් මාර්ගයට ලැබිල තිබුණා. දැන් ඒවා නිවා දමල තියෙන නිසා මාර්ගවල අන්ධකාරයක් තියෙනවා. නාම පුවරුවල විදුලි පහන් වසා දමන කාල වලදී සභාව මගින් දමන විදුලි බුබුළු පාරෙ ගමන් කරන මිනිසුන්ට ප්‍රයෝජනයක් වෙනවා. ඒ නිසා තමයි ගරු සභාපතිතුමා විසින් කොට්ඨාසයේ මන්ත්‍රීවරුන් සහභාගී කරගෙන ඒ අත්‍යවශ්‍ය ස්ථාන හඳුනාගෙන ඒ වැඩපිළිවෙළ ගෙනියන්මේ යෝජනාව දමල තියෙන්නෙ. මම ඒ පිළිබඳව අගය කිරීමක් කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය</u>**

ගරු සභාපතිතුමනි, මේ වීථි පහන් සම්බන්ධව මට ලොකු චෝදනාවක් පසුගිය කාලය තුල එල්ල වුණා. වීථි පහන් අවශ්‍ය තැන්වලට දාන්න වෙලා තියෙන්නෙ මෙච්චර කාලයක් අනවශ්‍ය තැන්වලට වීථි පහන් දමල තිබුණු නිසා. අත්‍යවශ්‍ය තැන්වලට වීථි පහන් සවි කලා නම් තවදුරටත් අත්‍යාවශ්‍ය තැන් තියෙන්න විදියක් නෑ. ගෙදරක එලියෙ විදුලි බල්බයකින් එලිය වැටෙන තැන්වලටම තමයි අපි වීථි පහන් සවි කරල තියෙන්නෙ. ඒ නිසා අඳුරු ස්ථානවල වීථි පහන් සවිවෙලා නැහැ. තව වීථි පහන් සවිකරත් වැඩක් නෑ. මගේ කොට්ඨාශයේ සමහර තැන්වල සවස තුන හතර වනතෙක් වීථි පහන් දැල්වෙනවා. ඒ වුනාට මගේ පාරෙ වීථි පහන දැල්වෙනවා ඒක ගලවගෙන එනවා කියලා මට දුරකථන ඇමතුමක් දීල කියනවා. මම සභාවේ නියෝජිතයෙක් වෙලත් මගේ පාරේ වීථි පහන ගලවගෙන එන්න පුලුවන් නම් 12 වෙනකන් දැල්වෙන විදුලි පහන් ගලවගෙන එන්න බැරි ඇයි කියල මට ප්‍රශ්නයක් වෙලා තියෙනවා. ඒ විදුලි බුබුල මම තමයි එතනට දාලා දුන්නෙ. නමුත් මම වීථි පහන් දල්වන්නෙවත් නිවන්නෙවත් නෑ. ප්‍රදේශයට සුළු වතුර ගැලීමකින් පවා කිඹුල්ලු එනවා. එතන බොහෝ අඳුරු ප්‍රදේශයක්. ඒ විදුලි බුබුල ගලවගෙන එන්න හැඳුවා. ඒ වගේම දැන් ඒ විදුලි පහන දැල්වෙන්නෙත් නැහැ. ඒක ගලවන්න පුලුවන්නම් දැන් ඔය පත්තුවෙන සියලු බල්බ් ගලවගෙන එන්න.

**<u>ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය</u>**

අනවශ්‍ය ස්ථාන වලට වීදි පහන් දල්වල නැහැ. ඒ වගේම තවත් අත්‍යවශ්‍ය තැන් තියෙනවා. ඒ තැන් වලටත් විදුලි පහන් දල්වල දෙන්න කියල කියනවා. මේ යෝජනාවට මම ප්‍රශංසා

කරනවා සභාපතිතුමාට. විදුලි බුබුළු නිවන්නැති සමහර තැන් තියෙනවා. මෙතෙක් අපේ වසම් තුල අපි වීථි පහන් සවි කරල තියෙන්නෙ අත්‍යවශ්‍යම තැන්වලට පමණයි.දැනට තියෙන වාතාවරණය අනුව අවශ්‍ය තැන්වලට වීථි පහන් දල්වල දෙන්න කියල මම ඉල්ලීමක් කරනවා.

<u>ගරු මන්ත්‍රී රවිත මොහොට්ටි මහතා</u>

මාලිම්බඩ බල ප්‍රදේශයේ නාගරික වෙලා තියෙන්නෙ බොහොම අඩු කොටසක්. ගොඩක් තියෙන්නෙ ගම්බිම්. ඒවායේ තියෙන පාරවල් බොහොම දුෂ්කරයි. පාරවල්වල බැදි වැවිල තියෙනවා. මගේ කොට්ඨාසයට පසුගිය සිකුරාදා අපේ ක්ෂේත්‍රයේ වැඩකරන අය 12.00 ට ඇවිත් 1.00ට ගියා. මොකද්ද  මේ ක්‍රමවේදය කියල දන්නෑ. ඉතින් හොරගොඩ වගේ ප්‍රදේශවල බැද්ද කපල ඉවර කරන්න බෑ. ඒ නිසා හොරගොඩ වගේ ප්‍රදේශ වලට වීථි පහන් අත්‍යාවශයි. වීථි පහන් සවිකරන්න කියන ඉල්ලීම මම කරනවා. අවුරුදු 4 තිස්සෙම අපට විදුලිපහන් සවිකරන්න  ලැබුන්නෑ. අවුරුදු 4ටම  අලුතින් සවි කලේ ලයිට් 15ක් විතර. මීට කලින් යෝජනාවක් ආවා මංසන්ධිවලට   ලොකු ලයිට් එකක් දාන්න. නමුත් ඒක ක්‍රියාත්මක වුනේ නෑ. මංසන්ධි ගොඩක් ,තෙලිජ්ජවිල පවා කරුවලේ තියෙන්නෙ අදටත්. විදුලි බල අර්බුදය ගැන කතා කළා. අපි මේ වෙලාවේ ඒකට සහයෝගය දක්වන්න ඕන. සූර්ය කෝෂ වලින් දැල්වෙන ලොකු ලයිට් එකක් මංසංන්ධිවල දල්වන්න පුලුවන්නම් විදුලි අර්බුදයටත් යම් විසදුමක් ලැබෙනවා. මන්ත්‍රීතුමිය කිව්වා වගේ දවල්ට දැල්වෙන විදුලි පහන්වලට විසදුමක් දෙන්න ඕන සභාපතිතුමා. කවුරුහරි බයිසිකලයක හරි යවල ඒ වගේ ස්ථාන හඳුනාගෙන ඒ ලයිට් ගලවල දාලා අවශ්‍ය තැන්වලට විදුලි බල්බ් සවි කරල දෙන්න කියන ඉල්ලීම කරනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

කම්කරුවන්ට තමන්ට අදාල කොටසෙ තණකොළ කපන්න කියල අපි කියල තියෙනවා. උදේට අරුණ ගිහින් ඒ අදාළ කොටස් පෙන්වනවා. සමහර දිනවල මළ ගෙයක් වුනොත් ඒ අය අපි ඒ මළ ගෙදරට යන පාර සුද්ධ කරන්න යවනවා.

විදුලිය සම්බන්ධව කතා කළොත්, ඒ ගැන අපිට චක්‍රලේඛ 3ක් එවල තිබුණා. එකක තිබුණා පස්වරු  7.00ට බල්බ් දල්වල පෙරවරු 5.00ට නිවන්න කියලා.. අපි ඒකට නිවේදනයක් යැව්වා  පස්වරු 6.00ට දාලා පෙරවරු 6.00ට නිවන්න කියලා. ඊට පස්සෙ අවේලාවේ දැල්වෙන වීථිපහන් සියල්ල ගලවා ඉවත් කරන්න කිව්වා. මම  ඒක මුලින්ම පටන් ගත්තෙ මගේ නිවස අසල වීථි පහනින්.මට ලොකු චෝදනාවක් ආවා සභාපතිතුමාගේ ගෙදර ළඟ වීථි පහන ගලවගෙන ගිහින් කියලා.මම තමයි  හැමදාම මේ වීථි පහන් නිවන්නෙ.ඊට පස්සෙ මාලිම්බඩ නගරයෙ අවේලාවේ දැල්වෙන වීථිපහන් නිව්වා.පස්සෙ ඕනම කෙනෙක්ගෙ  උදේ 6.00න් පස්සෙ දැල්වෙන වීථි පහන් ගලවගෙන එන්න කියල මම විදුලි කාර්මිකට කිව්වා.ඒක සමහරවිට මන්ත්‍රීතුමන්ලාගේ තුමියන්ලාගේ පාර වෙන්න පුළුවන්.ඒක පෞද්ගලිකව කරපු වැඩක් නෙමෙයි.

ඊළඟ චක්‍රලේඛය ආවේ මැයි 31 දක්වා නඩත්තු කිරීම් කරන්න එපා කියලා.ඊට පස්සෙ ආවා අත්‍යවශ්‍ය ස්ථානවල වීථිපහන් පමණක් නඩත්තු කරන්න කියලා.ඉතින් නිලධාරීන් වීථි පහන් දෙන්නෙ ඉතා සීමිත ප්‍රමාණයක්.වීථි පහන් කියන එක මිනිසුන්ට අත්‍යවශ්‍යයි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**තීරණ අංක 5:7**</u>

බල ප්‍රදේශයේ අවශ්‍ය තැන් වලට වීථි පහන් අලුතෙන් සවි කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:8</u>**
මාලිම්බඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම.

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134වගන්තියේ(1) වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මාලිම්බඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛන හා සිතියම් මගින් විස්තර කෙරෙන සීමාවන් මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය මත දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**<u>දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන ගම් ප්‍රදේශ ඇතුලත් උපලේඛනය.</u>**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) පිහිටියාවූ අංක 350 මාලිම්බඩ උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 402 මාලිම්බඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 402A මාලිම්බඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 351B කිරිමැටිමුල්ල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 400A අකුරුගොඩ බටහිර ග්රාම නිලධාරී කොට්ඨාසයද, අංක 400B අකුරුගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 402B ගල්පමුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක403A සුල්තානාගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 403 සුල්තානාගොඩ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 403B සුල්තානාගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 353Aතෙලිජ්ජවිල ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 353 කඩුකන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 356 දම්පැල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 355 හොරගොඩ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 355D හොරගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 355A ඇල්ගිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 350A කටුවන්ගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සැදුම්ලත්

- උතුරට- ඉපොල්ඔලුව හන්දියේ සිට හේනෙගම කන්දහේන කර්මාන්ත ශාලාව දක්වාත්, එතැන් සිට හොරගොඩ දකුණ වැල්ලාන පාර සිට වැල්ලාන පන්සල දක්වාත්, ඉපොල්ඔලුව හන්දියේ සිට හොරගොඩ පාර දහය කණුව

ඇල්ගිරිය දක්වාත්, එතැන් සිට පුළුන්දෙනිය හන්දියේ සහා නාම පුවරුව දක්වාත්ය. ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට 200m තෙක් ද,

- නැගෙනහිර- මාලිම්බඩ මං සන්ධියේ සිට වැල්ලේතොට පාලම තෙක්ද ඕගස්පේ හන්දියේ සිට අත්තුඩාව නම සඳහන් ගල්පුවරුව පිහිටි ස්ථානය තෙක්ද නැවත ඕගස්පේ හන්දියේ සිට අත්තුඩාව නම සඳහන් ගල්පුවරුව පිහිටි ස්ථානය තෙක් ද නැවත ඕගස්පේ හන්දියේ සිට මාතර පාර ජයන්ති පාලම තෙක්ය. ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට 200m තෙක් ද,
- බටහිර-තෙලිජ්ජවිල හන්දියේ සිට වැලිගම අකුරැස්ස මාර්ගයේ සමරසිංහාරාම විහාරය තෙක්ද අකුරුගොඩ හන්දියේ සිට නැටැව්ව හන්දියේ 02 කණුව තෙක් ද නැටැව්ව හන්දියේ සිට නැටැව්ව පාර 2500 තේ කොළ කඬේ අසල තෙක්ද ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට 200m තෙක් ද,
- දකුණට - කිරිමැටිමුල්ල හන්දියේ සිට අකුරුගොඩ හන්දිය පසුකර සුල්තානාගොඩ හන්දියේ ගල්ළිඳ ද එතැන් සිට ගොඩගම පාර 02 කණුව තෙක්ද ගල්ළිඳ අසලින් ලැබීම ක්‍රීඩාංගණය පාර සිට කුරුඳුවත්ත හන්දිය තෙක්ද අකුරුගොඩ හන්දියේ සිට ගල්පමුණ මාර්ගය නාගොඩ හන්දිය තෙක්ද ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට 200m තෙක් ය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:8</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134වගන්තියේ(1) වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මාලිම්බඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛන හා සිතියම් මගින් විස්තර කෙරෙන සීමාවන් මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය මත දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන ගම් ප්‍රදේශ ඇතුලත් උපලේඛනය.</u>**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) පිහිටියාවූ අංක 350 මාලිම්බඩ උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 402 මාලිම්බඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 402A මාලිම්බඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 351B කිරිමැටිමුල්ල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 400A අකුරුගොඩ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 400B අකුරුගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 402B ගල්පමුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක403A සුල්තානාගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 403 සුල්තානාගොඩ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 403B සුල්තානාගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 353Aතෙලිජ්ජවිල ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 353 කඩුකන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 356 දම්පැල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 355 හොරගොඩ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 355D හොරගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 355A ඇල්ගිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයද, අංක 350A කටුවන්ගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයද යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සැදුම්ලත්

- උතුරට- ඉපොල්ඔලුව හන්දියේ සිට හේනෙගම කන්දහේන කර්මාන්ත ශාලාව දක්වාත්, එතැන් සිට හොරගොඩ දකුණ වැල්ලාන පාර සිට වැල්ලාන පන්සල දක්වාත්, ඉපොල්ඔලුව හන්දියේ සිට හොරගොඩ පාර දහය කණුව ඇල්ගිරිය දක්වාත්, එතැන් සිට පුළුන්දෙනිය හන්දියේ සභා නාම පුවරුව දක්වාත්ය. ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට 200m තෙක් ද,
- නැගෙනහිර- මාලිම්බඩ මං සන්ධියේ සිට වැල්ලේතොට පාලම තෙක්ද ඕගස්පෙ හන්දියේ සිට අත්තුඩාව නම සඳහන් ගල්පුවරුව පිහිටි ස්ථානය තෙක්ද නැවත ඕගස්පෙ හන්දියේ සිට අත්තුඩාව නම සඳහන් ගල්පුවරුව පිහිටි ස්ථානය තෙක් ද නැවත ඕගස්පෙ හන්දියේ සිට මාතර පාර ජයන්ති පාලම තෙක්ය. ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට 200m තෙක් ද,

- බටහිර-තෙලිජ්ජවිල හන්දියේ සිට වැලිගම අකුරැස්ස මාර්ගයේ සමරසිංහාරාම විහාරය තෙක්ද අකුරුගොඩ හන්දියේ සිට නැටැව්ව හන්දියේ 02 කණුව තෙක් ද නැටැව්ව හන්දියේ සිට නැටැව්ව පාර 2500 තේ කොළ කඩේ අසල තෙක්ද ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට 200m තෙක් ද,
- දකුණට - කිරිමැටිමුල්ල හන්දියේ සිට අකුරුගොඩ හන්දිය පසුකර සුල්තානාගොඩ හන්දියේ ගල්ළිඳ ද එතැන් සිට ගොඩගම පාර 02 කණුව තෙක්ද ගල්ළිඳ අසලින් ලැබීම ක්‍රීඩාංගණය පාර සිට කුරුඳුවත්ත හන්දිය තෙක්ද අකුරුගොඩ හන්දියේ සිට ගල්පමුණ මාර්ගය නාගොඩ හන්දිය තෙක්ද ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට 200m තෙක් ය.

**<u>යෝජනා අංක 5:9</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයට ජෙනරේටයක් මිලදී ගැනීමේ කාර්යය සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව ලෙස පහත නම් සඳහන් සාමාජිකයින් සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

i. **සභාපති -** ජේ.ජී.ජනත් මයා-විදුලි ඉංජිනේරු,දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය, ගාල්ල.
ii. **සාමාජික** - බී.ඒ.එස් සාරංග මයා - ඉංජිනේරු, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, මාතර.
iii. **සාමාජික** - බී.ඒ.කුමුදු ශාන්ත මයා-තාක්ෂණ නිලධාරී, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:9</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයට ජෙනරේටයක් මිලදී ගැනීමේ කාර්යය සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව ලෙස පහත නම් සඳහන් සාමාජිකයින් සුදුසු බවට තීරණය විය.

iv. **සභාපති -** ජේ.ජී.ජනත් මයා-විදුලි ඉංජිනේරු,දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය, ගාල්ල.
v. **සාමාජික** - බී.ඒ.එස් සාරංග මයා - ඉංජිනේරු, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, මාතර.
vi. **සාමාජික** - බී.ඒ.කුමුදු ශාන්ත මයා-තාක්ෂණ නිලධාරී, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

**<u>යෝජනා අංක 5:10</u>**

ලෝක ළමා දිනය වෙනුවෙන් පෙර පාසල් දරුවන් සඳහා වින්දනාත්මක අධ්‍යාපනික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය සභා අරමුදලින් රුපියල් දෙලක්ෂ පනස්දහසක මුදලක් වැය කිරීමටත්, ඒ සඳහා පහත ඇස්තමේන්තුව අනුමත කිරීමටත් යෝජනා කරමි.

| අනු අංකය | වියදම් දරණු ලබන කාරණය | ස්ථානය | දිනය | ප්‍රතිලාභීන් ගණන | දළ වියදම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| 01 | පෙර පාසල් දරුවන් සඳහා ඉගනුම් අධාරක ලෙස සෙල්ලම කව සඳහා සෑම දරුවෙක් වෙනුවෙන්ම සෙල්ලම් උපකරණයක් ලබාදීම | මාලිම්බඩ ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය | 2022 ඔක් තෝබ ර් | 625 | සෙල්ලම් උපකරණ 625 ක් රු. 400.00 වටිනාකමකින් යුතුව මිලදී ගැනීම රු. 400.00 × 625 = 250,000.00 |
| | **එකතුව** | | | | රු. **250,000.00** |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:10</u>**

ලෝක ළමා දිනය වෙනුවෙන් පෙර පාසල් දරුවන් සඳහා වින්දනාත්මක අධ්‍යාපනික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය සභා අරමුදලින් රුපියල් දෙලක්ෂ පනස්දහසක මුදලක් වැය කිරීමටත්, ඒ සඳහා පහත ඇස්තමේන්තුව අනුමත කිරීමටත් තීරණය විය.

| අනු අංකය | වියදම් දරණු ලබන කාරණය | ස්ථානය | දිනය | ප්‍රතිලාභීන් ගණන | දළ වියදම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| 01 | පෙර පාසල් දරුවන් සඳහා ඉගනුම් අධාරක ලෙස සෙල්ලම කව සඳහා සෑම දරුවෙක් වෙනුවෙන්ම සෙල්ලම් උපකරණයක් ලබාදීම | මාලිම්බඩ ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය | 2022 ඔක් තෝබ ර් | 625 | සෙල්ලම් උපකරණ 625 ක් රු. 400.00 වටිනාකමකින් යුතුව මිලදී ගැනීම රු. 400.00 × 625 = 250,000.00 |
| | **එකතුව** | | | | රු. **250,000.00** |

**<u>යෝජනා අංක 5:11</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලය තුළ නිලධාරීන් විශාල වශයෙන් සිටින නිසාත්, ආයතනයේ ඉඩකඩ නොමැති නිසාත්, තෙලිජ්ජවිල මහජන පුස්තකාලයේ පහල මාලය තුළ ප්‍රාදේශීය සභා උපකාර්යාලයක් පවත්වන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඉදිරි සභා වාරයට කල් තබන ලදී.

**<u>යෝජනා අංක 5:12</u>**

අලස්වත්ත වික්‍රම මහතාගේ නිවස අසල සිට අධිකාරිවිල වෙල්යාය දක්වා මාර්ගය සංවර්ධනය කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>

ගරු සභාපතිතුමනි, මෙම මාර්ගය අලස්වත්ත මුල්ම පදිංචිකරුවා පදිංචි වුණ මාර්ගය. කාපට් ලක්ෂයේ වැඩසටහන යටතේ මෙම මාර්ගයත් දාලා තිබුණා. නමුත් දැනට මේ වැඩසටහන ක්‍රියාත්මක වෙන්නැහැනේ. මේ වික්‍රම මහතාගේ නිවස අසල ඇත්තටම වතුර රැඳිල ලොකු වතුර වලක් තියෙනවා. එතැනින් ගමනාගමන කටයුතු අඩාල වෙනවා හැමදාම. කාපට් මාර්ගයට මැනුම් කරන අවස්ථාවේ සභාපතිතුමත් ඒ මාර්ගයට ගිහින් බැලුවා. අපට කොන්ක්‍රීට් කරන්න බැරි නිසා එතනට පොඩි සිලින්ඩර කටක් දාලා වතුර පහලට බැස යන ආකාරයට ජේ.සී.බී.එක දාලා සකස් කරාම ඇති.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:12</u>**

අලස්වත්ත වික්‍රම මහතාගේ නිවස අසල සිට අධිකාරිවිල වෙල්යාය දක්වා මාර්ගය සිලින්ඩර් කටක් යොදා සකස් කිරීමට තීරණය විය.

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.-නැත.

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

**9). වෙනත් කරුණු.**

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>

ගරු සභාපතිතුමනි අපේ සභා කාර්යයන්ට අදාළ කරුණක් පිළිබඳව මම කතා කරන්නේ. මේ වැසි කාලගුණය නිසා ඩෙංගු උවදුර වැඩි වෙලා තියෙනවා. කිරිමැටිමුල්ල කොට්ඨාසයේ මේ වෙනකොට මම දැනුවත්ව රෝගීන් 10ක් පමණ සිටිනවා. මුළු බල ප්‍රදේශය තුළම මෙම ඩෙංගු රෝගය සීඝ්‍රයෙන් පැතිරී ගියා පහුගිය කාලය තුළ. වැසි අඩු වුණාම සමහරවිට අඩුවෙන්න පුළුවන්. පහුගිය කාල පරිච්ඡේදයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු කාර්යය බහුල වුණ නිසා මිනිසුන් දැනුවත් කිරීමේ අඩුවක් වුණාද දන්නෑ. ඒ නිසා MOH එකත් එක්ක සම්බන්ධවෙලා මිනිස්සු දැනුවත් කිරීමේ වැඩසටහනක් කළොත් හොඳයි කියල මම හිතනවා. වෙනදනම් අපි දකිනවා රාජ්‍ය නිලධාරීන් නිවෙස්වලට ගිහිල්ල දැනුවත් කිරීම් කරනවා. නමුත් අපි මේ කාල සීමාවෙදිනම් එහෙම දැක්කෙ නෑ.මගේ කොට්ඨාසයේ වගේම මම හිතනවා අනෙක් කොට්ඨාසවලත් මෙවැනි ගැටලු ඇති කියලා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමග සාකච්ඡා කරල යම් දිනයක මුළු බල ප්‍රදේශය පුරාම ඩෙංගු මර්ධන වැඩසටහනක් සංවිධානය කරල ක්‍රියාත්මක කරන්න කියල මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>
අපි දැනට ගෙවතු වගා වැඩසටහන සමග කොට්ඨාස සියල්ලෙම එක දවසෙ ඇවිදීමට යොදාගෙන තියෙනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ටත් මේ ගැන දැන්නුවා. ප්‍රචාරයක් සමග ඩෙංගු මර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන්න ඔවුන් එකඟ වුණා.

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>
ඒ වගේම සභාපතිතුමා අපේ අර හින්නක්කමුල්ල ඉඩමේ තත්ත්වය මොකද්ද කියල දැනගන්න කැමතියි.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, හින්නක්කමුල්ල ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අයත් නොවන ප්‍රදේශයක පිහිටා තිබෙන ඉඩමක සංවර්ධනය කරන කොටස්වලින් කොටසක් ඉල්ලීමට නීතිමය පදනමක් නැහැ. කැමැත්තෙන් යමක් දුන්නොත් ලබා ගන්න පුළුවන්. අපි ඔහු සමග සාකච්ඡා කරල පර්චස් 8 ක භූමි භාගයක් ලබා ගත්තා. ඊට අමතරව ඉල්ලීමක් කිරීමට හැකියාවක් නෑ. විදුලිය, ජලය, මාර්ග ඉදිකිරීම් කරන ලෙස දැන්වීමට නීතිමය පදනමක් නෑ. මේ ඉඩම කැබලි කර විකුණන ඉඩමක් නොවන බවට සභාව වෙත දන්වා තිබෙනවා. ඉඩමට අනුමැතිය ලබා දෙන විට නැවත කැබලි කර විකිණීමට නොහැකි වන ලෙස කොන්දේසි පනවනවා.

<u>ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා</u>
සභාපතිතුමා මාර්ග කාපට් ව්‍යාපෘතිය යටතේ ගුණසේකර මාවතෙන් පටන් අරන් ගංගාසිරි මාවතෙන් අවසන් වෙන්න ඒ මාර්ගයේ වැඩ පටන් ගත්තා. දැන් ඒ මාර්ගය දැඩි අර්බුදකාරී තත්ත්වයකට පත්වෙලා තියෙන්නෙ. පැතිබැම්මක් ගැහුවා. පැතිබැම්ම ගහල එතනින් නැවතුනා. වාහන ඇවිල්ල දැන් ඒ පාර සම්පූර්ණ කැඩිල තියෙන්නෙ. බයිසිකල් දෙක තුනක් අනතුරට ලක්වුණා. ඒව පැතිබැම්ම යටට ගියොත් ජීවිතයක් වුණත් නැතිවෙන්න පුළුවන්. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා ජේ.සී.බී. යන්ත්‍රයක් ,ටිපර් රථයක් ලබා දීල ඒ පැතිබැම්ම පස් පුරවල පාරෙ මට්ටමට හදා දෙන්න කියලා.

<u>ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා</u>
සභාපතිතුමා පොදුවෙළඳපොළේ කඩ කාමර ඉදිරිපිට තිබෙන පදික වේදිකාව අවහිර කිරීම නිසා එය ඉවත් කරන්න සභාවේ නිලධාරීන් ගිහින් කටයුතු කළා. නමුත් ඒ ගියපු නිලධාරීන්ටත් ඒ අය තර්ජන බලපෑම් කරල තියෙනවා. මේ නිලධාරී මහත්වරු කියනවා පොලීසියත් එතනට ගියා කියල. ඒ අවහිරතාවය කළ පුද්ගලයගේ භාණ්ඩ තවමත් එහෙමම තියෙනවා. අනෙක් අය ඉවත් කරගෙන තියෙනවා. එම වෙළඳ මහතුන් ඉදිරියේදී සභාවට එන්න ඉඩ තියෙනවා. ඒ නිසා මේකට පියවරක් ගන්න කියල ඉල්ලනවා. අනෙක් වෙළඳ මහත්වරු ඒ ගැන කලකිරිල ඉන්නේ.

දෙවන කරුණ තමයි මාලිම්බඩ කොට්ඨාසයේ තියෙන කසල අපි ගන්නෙ නෑ කියල මොකක්හරි ගැටලුවක් තියෙනවද? මුදල් ගෙවලත් කසල ගෙනියන්නෑ කියනවා. ඒ ගැන හොයල බලල අවශ්‍ය කටයුතු කරන්න කියල ඉල්ලනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>
අවුරුදු දෙකක්ම එයාල සල්ලි ගෙව්වෙ නෑ. සල්ලි ගෙවලනම් කසල ගෙනියන්න පුලුවන්.

<u>ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා</u>
සභාපතිතුමා මාර්ග සංවර්ධන අධිකාරියෙන් සංවර්ධනය කරපු පාරවල් මග වැඩ නතර කරල තියෙනවා. මේ ගොඩක් ප්‍රාදේශීය සභාව සතු පාරවල්. ඒවා තියෙන්නෙ ඇත්තටම අවිධිමත්

විදියට. මේ මාර්ගවල දැන් යන්න බෑ. ඒව සභාවෙන් මැදිහත්වෙලා තාවකාලිකව හරි යන්න පුලුවන් ආකාරයට සකස් කරල දෙන්න. ඒ වගේම හොරගොඩ පාතෙගම මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කරද්දි ලොරි ගියේ ඕපිට පාරෙ. ඒ පාරෙ එක තැනක් කඩාගෙන ගිහින් තියෙනවා. ඒ ඕපිට මාර්ගයට ඇතුළුවන තැන සභාව මගින් හරි සංවර්ධනය කරල දෙන්න කියල ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී දික්මාදූගොඩගේ බන්දුල මහතා**

ඒ යෝජනාවට මමත් දායක වෙනවා. මොකද ඇල්ගිරියෙ කිරිඅම්මගල දක්වා පාර කාපට් ව්‍යාපෘතියට ඇතුළත් කළා. කාපට් ව්‍යාපෘතිය කරන්න බැකෝ එකෙන් සුද්ද කරල මැනුම් කටයුතු කළා. ඒ ටික හෝදගෙන ගිහිල්ල දැන් පාරෙ යන්නත් බෑ. ඒ නිසා ඒ තැන් සකස් කරල දෙන්න කියල ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා**

සුල්තානාගොඩ විනිප්‍රඩ්වත්ත ඉඩම වෙන්දේසි කරන්න සූදානම් කරල තියෙනවා. ඒක අක්කර 25 ක පොල් ඉඩමක්. මේක වෙන්දේසි කරන්න යනවා කියලා ගමේ මිනිස්සු ඇවිල්ල මටත් කිව්වා මේ ගැන හොයල බලන්න කියලා. සභාවෙන් ඒ ඉඩමට ඇවිත් බැලුවා කිව්වා. සභාපතිතුමත් හිටියද දන්නෑ කිව්වා. මේ ගැන මොනවහරි ලිපිගොනුවක් සභාවට ලැබිල තියෙනවද කියල දැනගන්න කැමතියි.

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

මේ ඉඩමෙ යමක් කරන්න අපට බලතල තියෙනවා. ඔය ඉඩමෙ පොල් ගස් උගුලන්න ආපු වෙලාවෙ අනුමැතියකින් තොරව ගස් ගලවන්න එපා කියල පොලීසිය එක්ක ගිහින් මම ඒක නැවැත්තුවා. ඊටපස්සෙ නාගරික සංවර්ධන අධිකාරියෙන් ගිහින් මේ ඉඩම මැනල තියෙනවා. සභාවටත් කෑල්ලක් වෙන් කරල තියෙනවා. අපිට සම්බන්ධයක් නෑ. අපෙන් විමසීමක්වත් කරලත් නෑ. ඊට පස්සෙ ෆයිල් එක මෙහෙට භාර දුන්නා අනුමැතිය ගන්න. අඩු පාඩු ගොඩක් තියෙන නිසා මම ෆයිල් එක ආපහු යැව්වා භාර ගත්තෙ නෑ. අපි ගොවි සංවිධානයට ලියුමක් යවල තියෙනවා මේකට අනුමැතිය දෙන්න එපා කියලා. මේ ගැන නාගරික සංවර්ධන අධිකාරියටයි, ප්‍රාදේශීය ලේකම්ටයි ලියුමක් යවල තිබුණා අපිට පිටපතක් එක්ක. පිටපතට පිළිතුරු ලිපියක් යවන්න අවශ්‍ය නැතිවුණත් අපි යැව්වා මේ මේ ආයතනවලින් අනුමැතිය ලැබුණොත් විතරයි මම අනුමැතිය දෙන්නෙ කියලා. හැබැයි ඔතන මත 2ක් තියෙනවා. ගොවීන් කියනවා ඕක දෙන්න එපා කියලා. හැබැයි ගමේ කණ්ඩායමක් කියනවා මේකෙන් ගම දියුණු වෙනවා මේකට අනුමැතිය දෙන්න කියලා. අපේ ලසන්ත මන්ත්‍රීතුමත් ඒක දන්නවා. මේකෙන් සභාවට ලොකු ඉඩම් ප්‍රමාණයක් ලැබෙනවා. අඩි 20ක් රක්ෂිතයට වෙන් කරල තියෙනවා. මොන මතය ආවත් , අනුමැතිය ගන්න ඕන තැන්වලින් අනුමැතිය ආවට පස්සෙ තමයි අපි අනුමැතිය දෙන්නෙ. එතකන් භාර ගන්නෙ නෑ.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව